අ.පො.ස. උසස් පෙළ

13 ශ්‍රේණිය

# ඉතිහාසය I

පැය තුනයි

Channel NIE

**උපදෙස්**

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- කොටස් දෙකටම මුලු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

1. (1) දේවානම්පියතිස්ස (2) කාවන්තිස්ස (3) මහසෙන්
(4) ධාතුසේන (5) II මුගලන් (............)

2. (1) කදම්බ නදී (2) ජජ්ජර නදී (3) ගම්භීර නදී
(4) මහා වාලුකා නදී (5) කප්පකන්දර නදී (............)

3. (1) ලංකාපුර කිත්ති (2) ලංකාධිකාර බුදල් නා (3) ලංකාපුර දේව
(4) ලංකාගිරි සෝර (5) ලංකාධිකාරින් මඤ්ජු (............)

4. (1) මුල්ලේරියා සටන (2) දන්තුරේ සටන (3) බලන සටන
(4) රන්දෙනිවෙල සටන (5) ගන්නොරුව සටන (............)

5. (1) එඩ්වඩ් බාන්ස් (2) විලියම් ග්‍රෙගරි (3) ආතර් හැමිල්ටන්
(4) ජෝන් ඩොයිලි (5) ස්ටුවර්ඩ් මැකෙන්සි (............)

6. (1) මාතොට (2) කසාතොට (3) ලංකා පටුන
(4) දඹකොළ පටුන (5) ගෝකණ්ණ (............)

7. (1) ඇරිස්ටෝටල් (2) ප්ලිනි (3) අබුසයිද්
(4) මෙගස්තිනීස් (5) ටොලමි (............)

8. (1) රජගල ලිපිය (2) නාගිරිකන්ද ලිපිය (3) මිහින්තලේ පුවරු ලිපිය
(4) මහ ඇලගමුව ලිපිය (5) හැබැස්ස ලිපිය (............)

9. (1) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ (2) ශ්‍රී විජය රාජසිංහ (3) ශ්‍රී වික්‍රම රාජසිංහ
(4) කීර්ති ශ්‍රී රාජසිංහ (5) රාජාධිරාජසිංහ (............)

10. (1) උත්තර මන්ත්‍රී මණ්ඩලය (2) ජනාධිපතිවරණය (3) දෝෂාභියෝගය
(4) ජනමත විචාරණය (5) සමානුපාතික නියෝජනය (............)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක් පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංක ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. (1) වළගම්බා රජතුමා - පිත මහ රජ
(2) ගෝඨාභය රජතුමා - මේඝ වර්ණාභය
(3) මාඝ - කාලිංග විජය බාහු
(4) II රාජසිංහ රජතුමා - මහා ආස්ථාන
(5) VI පරාක්‍රමබාහු රජතුමා - ෂඩ් භාෂා පරමේශ්වර (............)

12. (1) තබ්බ වාපි - II උදය රජතුමා
(2) කාල වාපි - ධාතුසේන රජතුමා
(3) මණිහිරි වාපි - මහාසේන රජතුමා
(4) පත්ත පාෂාණ වාපි - IV මහින්ද රජතුමා
(5) ගිරිතට වාපි - II අග්ග බෝධි රජතුමා (............)

13. (1) දෙවිනුවර - ඉරුගල් කුලතිලක පිරිවෙන
(2) තොටගමුව - විජයබා පිරිවෙන
(3) එරබත්ගොඩ - ධර්මරාජ පිරිවෙන
(4) පැපිලියාන - සුනේත්‍රාදේවී පිරිවෙන
(5) කෑරගල - මහා පාය පිරිවෙන (............)

14. (1) අඹන්වෙල රාළගේ කැරැල්ල - එඩ්වඩ් බාන්ස්
(2) 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන - රොබට් බ්‍රවුන්රිග්
(3) 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන - ටොරිංටන්
(4) 1883 කොටහේන කෝලාහලය - ජේම්ස් ලොංඩන්
(5) 1915 සිංහල මුස්ලිම් කෝලාහලය - රොබට් චාමර්ස් (............)

15. (1) අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැක ගැනීම - වලිසිංහ හරිස්චන්ද්‍ර
(2) අමද්‍යප ව්‍යාපාරය ඇරඹීමට දායක වීම - අනගාරික ධර්මපාල
(3) යාපනයේ වන්නාර් පොන්නෙයි හින්දු විද්‍යාලය ඇරඹීම - ආරුමුග නාවලර්
(4) කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම - ටී.බී. ජයා
(5) ස්වභාෂා හා ද්විභාෂා පාසල් ඇරඹීම - ස්ටුවර්ඩ් මැකන්සි (............)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දක්වා ඇත. Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැලපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16. X Y

| X | Y |
|---|---|
| (1) කව් සිළුමිණ | A පොළොන්නරුව |
| (2) දළදා සිරිත | B දඹදෙණිය |
| (3) මයූර සංදේශය | C කුරුණෑගල |
| (4) බුදුගුණ අලංකාරය | D ගම්පොල |
| (5) දම් සරණ | E කෝට්ටේ |

(1) BCDEA (2) CDEAB (3) BEACD (4) EABCD (5) ABCDE (............)

17.

| X | Y |
|---|---|
| (1) නීල වාහිනී නදී | A කළු ගඟ |
| (2) ගෝණ නදී | B දැදුරු ඔය |
| (3) කප්ප කන්දර නදී | C කලා ඔය |
| (4) කාල නදී | D නිල්වලා ගඟ |
| (5) ජජ්ජර නදී | E මැණික් ගඟ |

(1) ABCDE (2) CBAED (3) DCEAB (4) BCDAE (5) DCABE (............)

18.

| X | Y |
|---|---|
| (1) IV බුවනෙකබාහු | A දඹදෙණිය |
| (2) III විජයබාහු | B යාපහුව |
| (3) IV පරාක්‍රමබාහු | C කුරුණෑගල |
| (4) I බුවනෙකබාහු | D ගම්පොල |
| (5) VI පරාක්‍රමබාහු | E කෝට්ටේ |

(1) ABCDE (2) DACBE (3) BCEAD (4) DCAEB (5) CADBE (............)

19.

| X | Y |
|---|---|
| (1) 1803 | A දුම්කොළ වෙළඳාම රජයේ ඒකාධිකාරය යටතට ගැනීම. |
| (2) 1812 | B වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇති කිරීම. |
| (3) 1840 | C මැක්ඩෝවල් උඩරට ආක්‍රමණය කිරීම. |
| (4) 1900 | D මුඩු බිම් පනත් සම්මත කර ගැනීම. |
| (5) 1921 | E විශ්ව විද්‍යාල කොලීජිය පිහිටුවීම. |

(1) CBAED (2) ACBDE (3) BCADE (4) ABCED (5) CADBE (............)

20.

| X | Y |
|---|---|
| (1) රජයට විරුද්ධව හර්තාල් ව්‍යාපාර | A සිරිමාවෝ බණ්ඩාරනායක |
| (2) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය | B ජේ.ආර්. ජයවර්ධන |
| (3) සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම | C ජෝන් කොතලාවල |
| (4) පළමු ජනරජ ව්‍යවස්ථාව | D ඩඩ්ලි සේනානායක |
| (5) විධායක ජනාධිපති ධූරය ඇති කිරීම | E එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක |

(1) BCDEA (2) DCEAB (3) CBAED (4) DEACB (5) CAEDB (............)

- අංක 21 සිට 25 දක්වා සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. ප්‍රාග් ඓතිහාසික මානවයා.
   (1) දඩයමින් මාංශමය ආහාර ලබා ගෙන ඇත.
   (2) කලපු ආශ්‍රිතව මුහුදු බෙල්ලන් ආහාරයට ගෙන ඇත.
   (3) බාර්ලි වගා කර ඇති බව හෝර්ටන් තැන්න ආශ්‍රිත පර්යේෂණවලින් හෙළි වී ඇත.
   (4) අනුරාධපුර ඇතුළු නුවරින් වෘත්තාකාර නිවාස තිබූ බවට සාධක ලැබී ඇත.
   (5) මෙවලම් තනා ගැනීම සඳහා බහුල වශයෙන් තිරිවාන ගල් භාවිත කර ඇත. (............)

22. වලගම්බා රජතුමා මුහුණ දුන් අභියෝග.
   (1) සත් ද්‍රවිඩ ආක්‍රමණය.
   (2) සෙන්පතියන් රජු අතහැර යාම.
   (3) පස් ද්‍රවිඩ ආක්‍රමණය.
   (4) තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල.
   (5) බැමිණිතියා සාගතය. (............)

23. යාපන රාජධානිය
   (1) යාල්පාන වෛපවමාලෛ කෘතියෙන් තොරතුරු ලබා ගත හැකි ය.
   (2) ආර්ය චක්‍රවර්ති පාලකයන් දොළොස් දෙනෙකු විසින් පාලනය කළ බවට තොරතුරු ලැබේ.
   (3) ඉබන් බතුතා යාපනයේ ආර්ය චක්‍රවර්ති ලංකාවේ සුල්තාන්වරයා ලෙස හඳුන්වා ඇත.
   (4) VI පරාක්‍රමබාහු රජතුමා සපුමල් කුමාරයා යවා ආර්ය චක්‍රවර්ති පරාජය කර ඇත.
   (5) වර්ෂය 1619 දී ලන්දේසීන් විසින් යාපනය රාජධානිය යටත් කර ඇත. (............)

24. කෝල්බෲක් - කැමරන් කොමිසම
   (1) උඩරට හා පහත රට ඒකාබද්ධ පාලනයක් ඇති කිරීම.
   (2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටු වීම.
   (3) දිවයින පළාත් නවයකට බෙදීම.
   (4) රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
   (5) සමස්ත දිවයිනට ම බලපාන පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය ව්‍යාප්ත කිරීම. (............)

25. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව
   (1) පාර්ලිමේන්තුව වෙනුවට ජාතික රාජ්‍ය සභාව ඇති විය.
   (2) මූලික මිනිස් අයිතිවාසිකම් සඳහන් විය.
   (3) ආචාර්ය කොල්වින් ආර් ද සිල්වාගේ මූලිකත්වයෙන් නිර්මාණය විය.
   (4) විධායක කාරක සභා පිහිටු විය.
   (5) අග්‍රාණ්ඩුකාර ධුරය වෙනුවට ජනාධිපති ධුරයක් ඇති කිරීම. (............)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා
  (A) සහ (B) පමණක් නිවැරදි නම් 1 ද
  (B) සහ (C) පමණක් නිවැරදි නම් 2 ද
  (C) සහ (D) පමණක් නිවැරදි නම් 3 ද
  (A) සහ (C) පමණක් නිවැරදි නම් 4 ද
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය | (B) සහ (C) පමණක් නිවැරදි ය | (C) සහ (D) පමණක් නිවැරදි ය | (A) සහ (C) පමණක් නිවැරදි ය | ප්‍රතිචාර එකක් හෝ දෙකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය |

26. පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධව කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?
   (A) දක්ෂිණ දේශයේ පාලකයා ලෙසින් දේශපාලනයට ප්‍රවිෂ්ට විය.
   (B) කාලිංග මාඝ පරාජය කර පොළොන්නරුව යටත් කර ගත්තේ ය.
   (C) II ගජබාහු සමඟ සමගි සම්මුතියකට එළඹිනි.
   (D) සංගමු ලිපියේ රජුගේ විදේශ ආක්‍රමණ ගැන සඳහන් වේ. (............)

27. කෝට්ටේ යුගයේ සාහිත්‍යය පිළිබඳ කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?
   (A) කව් සිළුමිණ රචනා කරන ලද්දේ VI පරාක්‍රමබාහු රජතුමා ය.
   (B) සංදේශ කාව්‍යවල ස්වර්ණමය යුගය ලෙස සැලකේ.
   (C) වීදාගම මහා මෛත්‍රීය හිමි වාසය කළේ මෙම යුගයේ දී ය.
   (D) වනවාසී හා ග්‍රාමවාසී හිමිවරු තරඟකාරී ලෙස ග්‍රන්ථ රචනා කළහ. (............)

28. බ්‍රිතාන්‍ය යුගයේ ආර්ථිකය සම්බන්ධව කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?
   (A) බ්‍රිතාන්‍ය යුගයේ දී මුල්වරට කුරුඳු වගාව ඇරඹිණි.
   (B) බ්‍රිතාන්‍යයන් විසින් වෙරළබඩ ප්‍රදේශවල පොල් වගාව ව්‍යාප්ත කළහ.
   (C) රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම නිසා පෞද්ගලික ආයෝජන දිරි ගැන්විණි.
   (D) ඇතැම් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට අනුග්‍රහ දැක්වූහ. (............)

29. 1956 මැතිවරණය සම්බන්ධව කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?
   (A) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කළේ ය.
   (B) ඉන්දියානු වතු කම්කරුවන්ගේ පුරවැසිභාවය විසඳීම සඳහා ඉන්දියානු අගමැති සමග ගිවිසුමක් අත්සන් කෙරිණි.
   (C) අගමැති ලෙස පත් වූයේ ඩඩ්ලි සේනානායක මහතා ය.
   (D) පත් වූ රජයට විරුද්ධව හර්තාල් ව්‍යාපාරයක් ඇති විය. (............)

30. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?
   (A) 1947 සිට 1970 දක්වා විදේශ ප්‍රතිපත්තියේ වෙනසක් සිදු නොවුණි.
   (B) සීතල යුද්ධ පසුබිම තුළ බ්‍රිතාන්‍ය සමඟ කිට්ටු සබඳතාවක් විය.
   (C) 1967 මැද භාගයේ සිට චීනය හා සෝවියට දේශය සමඟ මිත්‍රශීලී පිළිවෙතක් අනුගමනය කෙරිණි.
   (D) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය අගමැතිව සිටි කාලයේ බටහිර රටවල් සමඟ සමීප විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළා ය. (............)

- අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.

31. පැරණි ජනාවාසයක් වූ අනුරාධගාම පිහිටියේ කුමන ගංගා නිම්නයක ද?
   (1) කලා ඔය (2) ගල් ඔය (3) කිරිඳි ඔය
   (4) මල්වතු ඔය (5) දැදුරු ඔය (............)

32. වසභ රජුගේ පුතුන් පිළිබඳ සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
   (1) හැබැස්ස (2) පරමාකන්ද (3) මහ ඇලගමුව
   (4) රජගල (5) වැලඑල්ලුගොඩ කන්ද (............)

33. ගාල්ලේ ත්‍රෛභාෂා ශිලා ලේඛනය පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) නිශ්ශංක අලගක්කෝනාර (2) යුං ලෝ චීන අධිරාජයා (3) වීර අලකේෂ්වර
   (4) චෙන් හෝ චීන සෙන්පතියා (5) සේනෙවිරත් (............)

34. ඔස්ට්‍රියාවේ දොන් ජුවන් ලෙස පෘතුගීසීන් විසින් බෞතිස්ම කරනු ලැබුවේ කවරෙක් ද?
(1) ධර්මපාල (2) කොනප්පු බණ්ඩාර (3) යමසිංහ බණ්ඩාර
(4) කරල්ලියැද්දෙ බණ්ඩාර (5) වීර සුන්දර බණ්ඩාර (............)

35. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබන විට මෙරට අගමැති ලෙස කටයුතු කළේ කවරෙක් ද?
(1) ඩී.එස්. සේනානායක මහතා (2) ඩඩ්ලි සේනානායක මහතා
(3) ජෝන් කොතලාවල මහතා (4) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
(5) ඩබ්ලිව්. දහනායක මහතා. (............)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශන යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවෙනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | අරිට්ඨ කුමරු සසුන් ගත වීම භික්ෂු සාසනයේ ආරම්භය විය. | මහා මෙව්නාව පූජා කිරීම මහා විහාරයේ ආරම්භය විය. | (............) |
| 37. | මහා පරිමාණ වැව් තැනීමේ පුරෝගාමියා ධාතුසේන රජු ය. | පළමුවැනි පරාක්‍රමබාහු රජ සමය වාරි කර්මාන්තයේ කූට ප්‍රාප්තිය විය. | (............) |
| 38. | VI පරාක්‍රමබාහුගේ පියා ජයමහලෑන නම් විය. | චෙන් හෝ සෙනෙවියා විසින් ජයමහලෑන චීනයට රැගෙන ගොස් ඇත. | (............) |
| 39. | සමානුපාතික නියෝජනය හඳුන්වා දෙනු ලැබුවේ දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් ය. | විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ය. | (............) |
| 40. | ලම්භකර්ණ වංශයේ ආරම්භක රජු මහසෙන් ය. | නායක්කර් වංශයේ මෙරට ප්‍රථම පාලකයා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. | (............) |

පිළිතුරු I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 5 | 21 | 4 | 31 | 4 |
| 02 | 3 | 12 | 4 | 22 | 3 | 32 | 1 |
| 03 | 2 | 13 | 5 | 23 | 5 | 33 | 4 |
| 04 | 1 | 14 | 1 | 24 | 3 | 34 | 2 |
| 05 | 4 | 15 | 4 | 25 | 4 | 35 | 3 |
| 06 | 2 | 16 | 1 | 26 | 4 | 36 | 2 |
| 07 | 3 | 17 | 3 | 27 | 5 | 37 | 4 |
| 08 | 4 | 18 | 2 | 28 | 3 | 38 | 5 |
| 09 | -1 | 19 | 5 | 29 | 5 | 39 | 1 |
| 10 | -1 | 20 | 2 | 30 | 2 | 40 | 3 |